**පැලියගොඩ නගර සභාව - 2023**

**-----------------------------------**

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

පැලියගොඩ නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පැලියගොඩ නගර සභාවේ 2023 මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ 3.28 පරිච්ඡේදය ප්‍රකාරව හා එහි පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මඟපෙන්වීම් හි EG 6.2 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායමට ගැලපූ ක්ෂය වියදම රු.4,951,266ක් අඩුවෙන් ද පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් රු.17,872,279ක් වැඩියෙන් ද ආයෝජන පොලී ආදායම රු.4,759,339ක් වැඩියෙන් ද පෙන්වා තිබුණු අතර ජංගම වත්කම්වල අඩුවීම වූ රු.59,245,728ක් ගලපා නොතිබුණි . | ඉදිරි ගිණුම් වර්ෂයේ සිට නිවැරදිව සකස් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (I) | ප්‍රමිතියේ 3.29 පරිච්ඡේදය ප්‍රකාරව හා සවිස්තරාත්මක පහදාදීම් හා මඟපෙන්වීම් හි EG 6.3 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේ දී දේපල පිරියත හා උපකරණ සඳහා මුදලින් කළ ආයෝජන වටිනාකම රු.20,314,419ක් වැඩියෙන් ද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එකතුව රු. 21,993,414 ක් අඩුවෙන් ද මුදලින් ලද රු.8,311,790ක් වූ ආයෝජන ආදායම අඩුවෙන් ද දක්වා තිබුණි. | -එම- | -එම- |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | -------------- | ------------ |
| (අ) | 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු.8,447,074ක් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර කරනු වෙනුවට තැන්පත් ගිණුමට බැරකර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී වැඩ ආරම්භ කර වැඩ අවසන් නොවූ වාහන අංගනයේ වියදම වූ රු.2,000,000ක් නොනිමි ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබූ අතර සංශෝධිත ගිණුම තුලින් ද නිවැරදි ව කර නොතිබුණි. | 2023 සංශෝධිත ගිණුම තුළින් නිවැරදි කර ඇති බව. | -එම- |
| (ඇ) | විගණනය වෙත ලබාදුන් තොරතුරු අනුව සභාව සතු මාර්ග 120 ක වටිනාකම සංශෝධිත ගිණුම තුලින් නිවැරදිව වත්කම් ලෙස ගිණුම් ගත කරන බව දන්වා තිබුණද 2023 දෙසැම්බර් 21 දිනට වත්කම් ලෙස මාර්ග 13ක වටිනාකම පමණක් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ රු. 44,487,072ක් වූ වැටුප් ප්‍රතිපූර්ණය රු. 48,561,740ක් ලෙස රු. 4,079,668කින් මුලු ආදායම වැඩිපුර දක්වා තිබුණි. | වාචිකව පිළිගන්නා බව. | -එම- |

## 1.6.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------- | ------------- |
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ උපලේඛනවල එකතුන් හා මූල්‍ය ප්‍රකාශවල ගිණුම් 8 ක ශේෂයන් අතර රු. 10,057,591ක් වූ නොසැසඳුණු වෙනසක් පැවතිණි. | 2024 වර්ෂයේදී නිවැරදි කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ණයගැතියෝ | 4,216,270 | ලේඛන හා උපලේඛන | ණය ගැතියන් සඳහා උපලේඛන ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණද ඉදිරිපත් නොකළ බව වාචිකව පිළිගත් බව. | අදාළ උපලේඛනය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සුළු මුදල් | 11,503 | කාල විශ්ලේෂණය ලේඛන හා උපලේඛන | ඉදිරි වර්ෂයේ සිට නිවැරදිව උපලේඛන හා කාල විශ්ලේෂණයන් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | වැටුප් රහිත නිවාඩු | 14,000 | -එම- | -එම- | -එම- |
| (ඈ) | දේපල ණය පොළී ප්‍රතිපූර්ණය | 233,703 | -එම- | -එම- | -එම- |
| (ඉ) | ලී බඩු හා උපකරණ හා යන්ත්‍ර සඳහා ක්ෂය | 1,126,128 | උපලේඛනය | -එම- | -එම- |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත | | | |
| VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය | මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවටත් එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකර ඇති බවටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් ඉටුකළ යුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා අදාල විගණන සැළසුමේ පිටපතක් ඉදිරිපත් කරන බව. | යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | රජයේ මුදල් රෙගුලාසි 571 | එකතු වටිනාකම රු. 11,812,964 ක් වූ වර්ෂ 2 ඉක්මවූ තැන්පතු නියාදනය කර නොතිබුණි. | හැකි ඉක්මනින් නියාදනය කිරීමට කටයුතු සලසමින් පවතින බව. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන ගැසට් නිවේදනය | ආයතන 7ක් පරිසර බලපත්‍ර නොමැතිව කටයුතු කරමින් පැවතුණි. | ආයතන සඳහා මැයි මස වන විට පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරන බව. | යොමුගත ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ වියදම රු. 38,021,625ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 33,099,357 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| වරිපනම් හා බදු | 51,010 | 48,332 | 46,105 | 21,750 | 51,000 | 50,880 | 52,647 | 29,084 |
| කුලී | 5,685 | 2,197 | 4,415 | 2,265 | 4,875 | 2,125 | 5,060 | 2,176 |
| බලපත්‍ර ගාස්තු | 3,700 | 2,010 | 4,051 | 63 | 3,400 | 1,636 | 3,459 | 65 |
| වෙනත් ආදායම් | 24,746 | - | 39,466 | - | 30,424 | - | 74,221 | 235 |
| | 85,141 | 52,539 | 94,037 | 24,078 | 89,699 | 54,641 | 135,387 | 31,560 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **අතුරු ව්‍යවස්ථා** | | |
| (I) | කඩ බඳු දීම සඳහා අතුරු ව්‍යවස්ථා අවශ්‍ය නොවන බව ලේකම්වරයා විසින් විගණනයට දන්වා තිබුණද නගර සභා ආඥා පනතේ 157(6) (ඇ) පරිදි කඩ බඳු දීම සඳහා අතුරු ව්‍යවස්ථා පිළියෙල කර නොතිබුණි. | කඩ බඳු දීම සඳහා අතුරු ව්‍යවස්ථා අවශ්‍ය නොවන බව. | ආඥා පනත අනුව කටයුතු කළ යුතුය. |
| (II) | වාර්ෂිකව ප්‍රජා ශාලාව වෙන් කිරීමට අදාල ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පිළියෙල කර ගැසට් පත්‍රයේ පල කර නොතිබුණි. | ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා සකස්කරන බව. | අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **මහජන නියෝජන** | | |
| | 2023 වර්ෂයේදී ලැබී තිබුණු මහජන පැමිණිලි 03ක් විසඳා නොතිබුණි. | අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් ලබා දී ඇති බව. | කඩිනමින් විසඳීමට කටයුතු කළ යුතුය. |

**3.2 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයිතියක් නොමැති දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩමක ඉදිකළ 4 කණුව පොදු වැසිකිළි පද්ධතිය සඳහා වැය කර තිබූ රු.10,204,180 ක මුදල අවිධිමත් ගණුදෙණුවක් වූ අතර නගර සභා ආඥා පනතේ 110(ආ) වගන්තිය ප්‍රකාරව මහජනයා ගැවසෙන ස්ථානවල අවශ්‍ය පරිදි පොදු වැසිකිළි පහසුකම් සැපයිය යුතු වුවද මහජනයා නොගැවසෙන ස්ථානයක පිරිමි වැසිකිළි 3ක්, ගැහැණු වැසිකිළි 3 ක්, ආබාධිත වැසිකිළි 2 ක් හා ගැහැණු, පිරිමි නාන ස්ථාන 2ක් ලෙස විශාල වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමේ වියදම නිශ්කාර්ය වියදමක් ද විය. | ඉදිරියේ දී සැලකිය යුතු ආදායමක් ලබාගැනීම සඳහා ටෙන්ඩර් ප්‍රදානයකින් තොරව නගර සභාව මගින් පාලනය කරමින් සේවාව සැපයීමට අපේක්ෂා කරනු ලැබේ. | ව්‍යාපෘති ඉටුකිරීමට පෙර හිමිකම පිළිබඳව සහතික කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ සමීක්ෂණ වාර්තා අනුව ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු අය කිරීම සඳහා පරිසර බලපත්‍රයක් ලබා ගත යුතු හා ලබා ගත යුතු නොවන ආයතන, පරිසර බලපත්‍රයක් ලබා ගත යුතු වුවත් සුදුසුකම් සපුරා නොමැති ආයතන ලැයිස්තුගත කර නොතිබුණි. | ආදායම් පරීක්ෂකගෙන් ලබා ගන්නා වෙළඳ බලපත්‍ර තොරතුරු අනුව පරිසර බලපත්‍ර ලබා ගත යුතු ආයතන පමණක් ලේඛනගත කර සටහන් කර එම ආයතන වලින් සුදුසුකම් සපුරා ඇති ආයතන සඳහා පරිසර බලපත්‍රය ලබා දීමට කටයුතු කරන බව. | පරිසර බලපත්‍රයක් ලබා ගත යුතු ආයතන ලැයිස්තුගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 293 හා රීති 294 ප්‍රකාරව වූ තොරතුරු ඇතුලත් කර 2023 වර්ෂය වෙනුවෙන් සමීක්ෂණ ලැයිස්තුව පිළියෙල කර නොතිබුණි. | 2024 ව්‍යාපාර සමීක්ෂණ වාර්තාවට එකී සියළු තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | සමීක්ෂණ වාර්තාවට සියළු තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2023 වර්ෂය සඳහා ගලිබවුසර් සේවා ගාස්තු ගැසට් කර නොතිබුණි. | ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා සකස් කර ඉදිරි කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථා සකස් කර ඉදිරි කටයුතු කළ යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 408(iii) සහ බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2020 දෙසැම්බර් 03 දිනැති අංක LGD/13/2016(1) චක්‍රලේඛයට පටහැනිව සභාවට අයත් කඩ කාමර 34ක් සඳහා 2017 ජුනි 29 දිනැති තක්සේරුව අනුව 2018 මැයි 01 දින සිට මාසික කුලීය අයකර තිබුණි. | නව තක්සේරුව ක්‍රියාත්මක කර මාසික කුළිය අයකර ගැනීමට කටයුතු කරන ලෙස සභාව විසින් තීරණය කරන ලදි. | නියමිත කාලයේදී තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 408 (iii) ට හා (iv) ට හා බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2020 දෙසැම්බර් 03 දිනැති අංක LGD/13/2016(1) දරන චක්‍රලේඛයට පටහැනිව කඩ කාමර 22ක් සම්බන්ධයෙන් කටයුතු කර තිබුණු අතර ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසුවත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව එම බදුකරුටම හෝ ඔහුගේ යැපෙන්නන්ට හෝ අතුරු බදුකරුට හෝ නව ගිවිසුම් මගින් හා ගිවිසුමකින් තොරව බදුදී තිබුණි. | කඩ කාමර තත්ත්වය පිළිබඳවත් බදුකරුවන් පිළිබඳවත් සලකා බලා සියළු හිඟ මුදල් අයකර පැවති ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව අතුරු බදුකරුවන්ට බදු දීමේදී චක්‍රලේඛ ප්‍රකාරව සිදු කර ගිවිසුම්ගත වීම සියල්ල නීත්‍යානුකූලව අවසන් කර ඇත. | ප්‍රසම්පපදන ක්‍රියාවලිය අනුගමනය කර බදු දීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 103(I)(ආ) පරිදි අංක GY- 9334 දරන කැබ් රථයට 2023 පෙබරවාරි 06 දින සිදුවූ හදිසි අනතුර සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 104(I) (අ) ප්‍රකාරව පරීක්ෂණ ආරම්භ කර මුදල් රෙගුලාසි 104(3) හා 104 (4) ප්‍රකාරව පිළිවෙලින් ප්‍රාරම්භක වාර්තාවක් හා පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | අනතුර සම්බන්ධව ගරාජයට ඉදිරිපත් කර ලබා ගත්තා වූ මිල ගණන් අනුව වැයවන සම්පූර්ණ මුදල රක්ෂණ සංස්ථාව මගින් ලබා දෙන අතර ඒ සම්බන්ධයෙන් කිසිදු වෙනත් අමතර මුදලක් සභාවෙන් දැරීමට නොවන හෙයින් මේ පිළිබඳ වාර්තාවක් සපයා නොමැති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යාල කටයුතු කළමනාකරණය කිරීමේ මෘදුකාංග පද්ධති නොමිලේ ලබා ගැනීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ 2020 නොවැම්බර් 30 දිනැතිව එකඟ වී තිබුණු ගිවිසුම පිළිබඳව පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (I) | කාර්යයන්වල අවශ්‍යතාවයට ගැලපෙන පරිදි වූ මෘදුකාංග පද්ධතිවල පිරිවිතර පිළිබඳව හඳුනා ගැනීමක් සිදුකර නොතිබුණි. | අදාල ආයතනය විසින් මෘදුකාංග පිළිබඳ විස්තර ඇතුලත් කර ලිපියක් ලබා දී ඇති බව. | පිරිවිතර හඳුනා ගැනීමක් සිදුකළ යුතුය. |
| (II) | ගිවිසුමට අනුව පළමු වර්ෂය තුල සේවා සැපයීම නොමිලේ ඉටු කර දිය යුතු වුවත් පළමු වර්ෂය වූ 2021 වර්ෂය සඳහා 2021 මාර්තු 02 දින සේවා ගාස්තු වෙනුවෙන් රු.140,000ක් ද 2022 හා 2023 වර්ෂ වෙනුවෙන් රු.140,000ක් බැගින් ද ගෙවා තිබුණි. | අදාල ආයතනය විසින් 2020.11.06 දින ලබා දී ඇති ලිපිය 2020.11.30 දින සංශෝධනය කර ඇති බව හා ඒ අනුව ගෙවීම් සිදුකර ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | වවුචර් හා චෙක්පත් කළමනාකරණය යන මෘදුකාංගය සහ සියළුම ගිණුම් කළමනාකරණය යන මෘදුකාංගය මිලදී ගැනීම සඳහා 2022 වර්ෂයේදී රු.1,200,000 ක් ගෙවා තිබුණි. මේ සඳහා පිරිවිතර ලබාදී තිබුණ ද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මිල ගණන් ඉදිරිපත් කළ ආයතනවල පිරිවිතර අතර සැසඳීමක් සිදුකර නොතිබුණු අතර අවම මිල පමණක් සලකා තිබුණි. එසේම එම මෘදුකාංග මිලදී ගැනීමෙන් පසු ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා වන කොන්දේසි ඇතුලත් කර පුද්ගලික සමාගම සමඟ ගිවිසුමකට එළඹීමක් සිදු වී නොතිබුණි. | අදාල ආයතනය විසින් යෝජිත ගිවිසුමක් එවා තිබූ නමුත් ඒ සඳහා 100% ක එකඟත්වයක් සභාව නොමැති බැවින් සාකච්ඡා කර නව ගිවිසුමක් 2020.11.30 දින අත්සන් කරන ලද බව. | පිරිවිතර අතර සැසඳීමක් සිදුකර සුදුසු ආයතනය තෝරා ගැනීම කළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 2ක පුරප්පාඩුවක් ද, ද්විතීය මට්ටමේ තනතුරු 5ක පුරප්පාඩු 9ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 8ක පුරප්පාඩු 25ක් ද වූයෙන් සභාවේ කාර්යයවල කාර්යක්ෂමතාවයට බලපෑමක් විය. | ලේකම් හා ගණකාධිකාරී තනතුරු පවතින ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 2ක් වන අතර ඉන් ලේකම් තනතුරු සඳහා වැඩ බැලීම හා රාජකාරි ඉටු කිරීම සඳහා පරිපාලන නිලධාරී විසින් සිදු කරන බව හා ගණකාධිකාරී තනතුර කාර්යය මණ්ඩලය අනුමත වූ 2013.01.01 දින සිට පුරප්පාඩු වුවත් ගණකාධිකාරී උසස් ඩිප්ලෝමාව සමත් ගිණුම් විෂයය දැනුමැති කළමනාකරණ සේවා නිලධාරියෙකු මගින් ගණකාධිකාරී රාජකාරිය ඉටු කරනු ලබන බව. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. |